**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී .
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තා

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශිය සභාවේ, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැඩ නිම කළ කර්මාන්ත 12ක වටිනාකම වූ රු.5,590,021ක මුදලක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජර්නල් සටහන් මඟින් ගලපනු ලබන බව දන්වා සිටිමි. | කර්මාන්ත සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රු.702,515ක් වටිනා ඉඩම් 09ක්ද වටිනාකමක් සඳහන් නොකළ ඉඩම් 05ක්ද ප්‍රදාන වශයෙන් ලැබී තිබූ ඉඩමක්ද ලේඛනගත කර නොතිබූ අතර වටිනාකම හඳුනාගත් වත්කම්වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ වත්කම් ගිණුම් වලට ගැලපීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව තැන්පත් ගිණුමෙහි තැන්පත් කර තිබූ රු.445,360ක දේපල බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි වටිනාකම් සෘජුවම ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සභාව විසින් ඉඩම් අයිති කර ගැනීමට හා බලපත්‍ර ගාස්තු නොගෙවන්නන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග වලට එළඹ ඇති නඩු 31ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි නඩු සම්බන්ධව අසම්භාව්‍ය බැරකම් යටතේ හෙළිදරව් කරන බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභාව වෙත තෑගී ඔප්පු වශයෙන් ලැබී තිබූ ඉඩම් කොටස්වල හා ඉඩම් අනුබෙදීම් කිරීමට අදාළව වෙන්දේසි සමාගම් විසින් පවරා දී තිබූ පොදු ඉඩම් කොටස් 02ක වෙළඳපොල අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි ඉඩම් පිළිබඳ අවම වශයෙන් තාවකාලික තක්සේරුවක් ලබාගෙන හෝ ගිණුම් වලට ගැලපීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු ලංකා බැංකු ගිණුමේ අක්‍රීය බැංකු ගිණුම් 02ක | මෙම වටිනාකම් සහා අරමුදළට ගලපා ගිණුම් වාර්තාවල පෙන්වීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවති රු.808,112ක ශේෂයන් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම පමණක් සිදුකර තිබූ අතර, ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (උ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල්කිරීම් ලෙස ගිණුම්ගත කර තිබූ රු.18,162,505ක් තුළ රු.7,353,799ක් වූ වෙනත් ආදායම් වර්ග කිහිපයක් ඇතුළත් කර තිබුණි. | මෙම ආදායම් ශීර්ෂ වෙන් වෙන්ව දැක්වීමට කටයුතු කරන බව දන්වමි. | ආදායම් ශීර්ෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව මඟින් පාලනය වන පෙර පාසල් 15කට අයත් ළමුන් 750කගෙන් 2021 දෙසැම්බර් මාසය වන විට සභාවේ නම් සඳහන් කුවිතාන්සි මඟින් මුදල් එකතු කර බැංකු ගිණුම්වල තැන්පත් කර තිබුණු මුදල රු.6,695,197ක් විය. සභාවේ අනුමැතියකින් තොරව සභාවේ නම යොදාගෙන නිකුත් කර ඇති කුවිතාන්සි වලින් ලද මුදල් පෙර පාසල් සංවර්ධන සමිති ව්‍යවස්ථාව අනුව පෙර පාසල් නමින් විවෘත කර ඇති බැංකු ගිණුම්වල තැන්පත් කර විවිධ අවස්ථාවන්වලදී වියදම් දරා තිබුණි. එම වියදම්වලට අදාළ ගිණුම්, සභාවට ඉදිරිපත් කර නොතිබූ අතර පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පත්‍රිකාවට අනුව ගිණුම් සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධව සඳහනක් නොතිබුණි. තවද එම ගිණුම් කිසිදු විගණනයකට ලක්වී නොතිබුණි. එමෙන්ම සභාව විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කළ ගිණුම් අනුව සභා අරමුදලින් රු.13,698,856ක මුදලක් පෙර පාසල් සඳහා වියදම් කර තිබුණි. | ගිණුම්වල ගනුදෙනු නියාමනය කිරීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි. | ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර, වියදම්වලට අදාළ ගිණුම් සභාවට ඉදිරිපත් කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ, පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.80,947,611ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වූ වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.94,011,251ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු**<br><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෞද්ගලික අංශයට අදාළ වරිපනම් ඒකක 3949කින් රු.8,791,104ක වරිපනම් බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. 2022 අගෝස්තු 31 දින වන විට ඉන් ඒකක 794කින් රු.2,332,227ක් අයකර ගෙන තිබුණු අතර ඒකක 208කින් රු.508,955ක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කපා හැර තිබුණි.<br><br>**(ඇ) ව්‍යාපාර බදු**<br><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකක 39කින් රු.119,400ක ව්‍යාපාර බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. 2022 අගෝස්තු 31 දින වන විට ඉන් ඒකක 01කින් රු.3,000ක් අයකර ගෙන තිබුණු අතර ඉතිරි ශේෂය වූ ඒකක 38කින් රු.116,400ක් අයකර ගත හැකිව තිබුණි. | වරිපනම් බදු ඇතුළු හිඟ ආදායම් ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කර අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ආදායම් අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| **(ඇ) කඩ කුලී**<br><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩ කාමර 165කින් රු.4,328,150ක කඩ කුලී මුදලක් අයවිය යුතුව පැවතුණි. 2022 අගෝස්තු 31 දින වන විට ඉන් කඩ කාමර 76කින් රු.1,802,015ක් අයකර ගෙන තිබුණු අතර කඩ කාමර 16කින් රු.1,021,195ක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කපා හැර තිබුණි.<br><br>**(ඉ) බදු කුලී**<br><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකක 56කින් රු.2,731,160ක බදු කුලී මුදලක් අයවිය යුතුව පැවතුණි. 2022 අගෝස්තු 31 දින වන විට ඉන් ඒකක 12කින් රු.851,918ක් අයකර ගෙන තිබුණු අතර ඒකක 24කින් රු.421,878ක් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත කපා හැර තිබුණි. | අයකර ගැනීමට හෝ හිඟ අයකර නොහැකි ශේෂ සම්බන්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | හිඟ ආදායම් අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |